**ශීර්ෂය 334 බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුව**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්වාගණනය කළ මතය**

බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජුනි 23 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජුනි 28 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශවලින් 2020 දෙසැම්බර් 31 දිනට බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

සමාලෝචිත වර්ෂය තුල ස්ථාපිත කරන ලද නව දෙපාර්තමේන්තුවක් වූ බැවින් මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සඳහා පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම**

රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 06 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුව තිබුණත්, එම අවශ්‍යතාවයන්ගෙන් බැහැර වූ අවස්ථා පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 හි 10-1 ඡේදය යටතේ මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීමට අදාළ මාර්ගෝපදේශ හා ආකෘති පත්‍ර 3.1 ට අනුව 2020 වර්ෂයේ අවසාන භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශන ඇමුණුම් ලෙස මූල්‍ය ප්‍රකාශනයේ ඇතුළත් කළ යුතු වුවද SA 80 හා SA 92 ආකෘති පත්‍ර එසේ ඇතුළත් කර නොතිබුණි. | 2020 වර්ෂයේ අවසාන භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශන ඇමුණුම් ලෙස **SA 80** හා **SA** 92 ආකෘති පත්‍ර ඇතුළත් කර නොතිබූ බැවින් පිළිවෙලින් ඇමුණුම 01 හා ඇමුණුම් 02 ලෙස ඉහත ආකෘති පත්‍ර අවශ්‍ය කටයුතු සඳහා මේ සමඟ ඉදිරිපත් කරමි. | රාජ්‍ය මුදල් චක්‍ර ලේඛ 2/2020 ප්‍රකාරව කටයුතු කල යුතු වීම |
| (ආ) | බැඳීම් හා බැරකම් ප්‍රකාශය (SA -92) අනුව 2020 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.5,330,234 ක් දක්වා තිබූ නමුත් දෙපාර්තමේන්තුව විසින් එවැනි බැරකමක් දක්වා නොතිබුණි. දෙපාර්තමේන්තුව විසින් රු.363,035 ක බැරකම් දක්වා තිබූ නමුත් භාණ්ඩාගාරය එම බැරකම් දක්වා නොතිබුණි. මෙම නොසැසඳීම් සම්බන්ධයෙන් 02/2020 හි 10.1 ඡේදය මාර්ගෝපදේශ අංක 06 හි 3.4 අනුව සටහන් අංක (iii) අනුව කටයුතු කර නොතිබුණි. | සිගාස් පද්ධතියේ දෝෂයක් නිසා බැරකම් ඇතුලත් කිරිමට අතපසු වීමක් නිසා මෙම තත්වය ඇති වී ඇත. | රාජ්‍ය මුදල් චක්‍රලේඛ 02/2020 ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| (ඇ) 2020 වර්ෂය වෙනුවෙන් වූ බැරකම් රු.55,712 බැදීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයේ අඩුවෙන් දක්වා තිබුණි. | අතපසුවීමකින් බැදීම් බැරකම් ප්‍රකාශයට ඇතුලත් කිරිමට නොහැකි වී ඇත. | බැරකම් නිවැරදිව ඉදිරිපත් කළ යුතුවීම. |

## 1.6.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රජයේ නිලධාරින්ට අත්තිකාරම් බී ගිණුම 2021 මැයි 05 වන දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර අනුමත උපරිම හර ශේෂ සීමාව රු.30,000,000 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අග තථ්‍ය ශේෂය රු.38,930,765 ක් වූයෙන් රු.8,930,765 ක් අවසාන හර ශේෂ සීමාව ඉක්මවා තිබුණි. | අනුමැතිය ඉල්ලා ඇතත් මේ දක්වා ලැබී නැත. | අත්තිකාරම් “බී” ගිණුමේ සීමාවන් පිළිපැදිය යුතු වීම. |

# 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 වර්ෂයේදී සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.8,212,000,000 කින් රු.6,445,492,985 ක් හෙවත් සියයට 78 ක් ඉතිරිවී තිබුණි. මෙම ඉතිරි වීම් තුල පුනරාවර්තන වැය විෂයයන් දෙකක් සඳහා වෙන් කළ රු.5,100,000 හි මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි. | වර්ෂය තුල අනුමත කාර්ය මණ්ඩලය අනුයුක්ත නොවීම, ඇස්තමේන්තු රැකියා ලක්ෂයෙන් 34553 පමනක් බඳවා ගැනීම සහ මුළු පුහුණු වියදමින් කොටසක් පමණක් ගෙවීම නිසා ප්‍රතිපාදන ඉතිරිවූ බවට දක්වා ඇත. | වියදම් ඇස්තමේන්තු පිළියෙල කිරිම නිවැරදිව සිදුකල යුතුවීම. |

**2.2 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මු.රෙ. 371 (2) අනුව එක් කාර්යයක් වෙනුවෙන් එක් අවස්ථාවකදී උපරිමය රු.100,000 දක්වා පමණක් අත්තිකාරම් ලබාදිය හැකි වුවත් එක් කාර්යයක් වෙනුවෙන් නිලධාරීන් 5 දෙනෙකුට රු.100,000 බැගින් රු.500,000 ක් ලබා දී තිබූ අතර එම කාර්යය සඳහා අනුමත වියදම් ඇස්තමේන්තුවක්ද නොතිබුණි. | රන්ටැඹේ පුහුණු පාඨමාලාව සඳහා කාර්යයන් 05 ක් වෙනුවෙන් අත්තිකාරම් ලබා ගන්නා ලදී | මුදල් රෙගුලාසි 317 (2) ප්‍රකාරව කටයුතු කිරීම. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 සැලසුම් කිරීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ජනාධිපති කාර්යාලය සතුව පැවති භාණ්ඩාගාර බිල්පත් 09 ක් දෙපාර්තමේන්තුව වෙත පවරාදී තිබූ අතර භාණ්ඩාගාර බිල්පත්හි ආයෝජනය කල්පිරීමෙන් පසු ලද රු. 1,152,136,263 ක මුදල භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කර තිබුණද භාණ්ඩාගාර බිල්පත් පැවරීමේ අරමුණ වූ දෙපාර්තමේන්තුවේ වියදම් අවශ්‍යතාවයන් සඳහා උපයෝජනය කිරීම හෝ ප්‍රති ආයෝජනය කිරීම යන කාර්යයන් ඉටුව නොතිබුණි. | භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක **TO/BE2/05/MPDTF/2020** හා 2020/08/04 දිනැති ලිපිය හා ආරක්ෂක අමාත්‍යාංශයේ ප්‍රධාන මූල්‍ය නිලධාරීගේ **MOD/FIN/06/02/11** හා 2020/09/03 දිනැති ලිපිය ප්‍රකාරව උක්ත භාණ්ඩාගාර බිලපත් හි ආයෝජන කල් පිරීමෙන් පසු ලද වටිනාකම් භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කර ඇත. භාණ්ඩාගාර බිල්පත් මෙම දෙපාර්තමේන්තුව වෙත පැවරීමේ අරමුණ වූ දෙපාර්තමේන්තු වියදම් අවශ්‍යතාවයන් සඳහා උපයෝජනය කිරීම වේ. අයවැය ඇස්තමේන්තුවල ප්‍රතිපාදනවලට අනුකූලව හා අවශ්‍යතා ප්‍රමුකත්වය මත මාසිකව මහා භාණ්ඩාගාරයෙන් අග්‍රිම වශයෙන් ඉල්ලුම්කර සිදු කරනු ලබයි. භාණ්ඩාගාර | අපේක්ෂිත අරමුණු ළඟාකර ගැනීමට කටයුතු කිරීම. |

| | | |
|---|---|---|
| | | මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක **TOD/BE2/05/MPDTF/2020** හා 2020.03.05 දිනැති ලංකා බැංකු ප්‍රධාන කාර්යාලයේ සාමාන්‍යාධිකාරී, ජාත්‍යන්තර භාණ්ඩාගාර ආයෝජන අමතනලද ලිපියෙහි ඇමුණුම 01 හි සඳහන් භාණ්ඩාගාර බිලපත් 09 කල්පිරීමේදී වටිනාකම රු. 1,147,851,094 ක් ලෙස දක්වා ඇති අතර එම භාණ්ඩාගාර බිල්පත් උපලබ්ධි වීමෙන් සත්‍ය වශයෙන්ම දෙපාර්තමේන්තු නිල බැංකු ගිණුමට බැරවී ඇති මුදල රු. 1,152,136,263 කි. මෙම වෙනස සඳහා ප්‍රධාන වශයෙන් සාධක 2 ක් හෙතුවී ඇත.<br>ඇමුණුම 01 හි භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීමේදී ගෙවීමට එකඟ වී ඇති පොලී අනුපාතය වෙනස් වීම.<br>2019.02.01 දින ආයෝජිත රු.47,006,135.24 ක භාණ්ඩාගාර බිල්පත ඇමුණුමෙහි සඳහන් පරිදි කල්පිරෙන දිනය 2020.01.31 ලෙස සඳහන් වුවද ඒ වන විට මෙම දෙපාර්තමේන්තුව ස්ථාපිතව නොතිබූ බැවින් ප්‍රති ආයෝජනය වී ඇති අතර ඒ අනුව එදිනට මුහුණත වටිනාකම ප්‍රති ආයෝනයෙන් 2021.01.29 දිනට ලද පොලියද ගිණුම් ගත වීම. |

**3.2 කාර්යභාරයන් ඉටු නොකිරීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 අප්‍රේල් මස වන විටත් මු.රෙ 756 ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර නොතිබුණි. | භාණ්ඩ සමීක්ෂණය සිදුකරමින් පවතී | රාජ්‍ය මුදල් චක්‍ර ලේඛ අංක 01/2020 හා 20.08.28 දිනැති චක්‍ර ලේඛයේ 11 ඡේදය ප්‍රකාරව කටයුතු කල යුතුවීම. |

**3.3 ප්‍රසම්පාදනයන්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 ඡේදයට අනුව භාණ්ඩ ප්‍රසම්පාදනය වෙළඳපොළ මිල සැදහුම් ක්‍රමය ( **Shopping Method)** යටතේ සිදු කරන අවස්ථා වලදී දක්වා ඇති සීමාවන් යටතේ එක් එක් ප්‍රසම්පාදන මට්ටම් තීරණය කළ යුතු වුවත් එම ප්‍රසම්පාදන සීමාවන් ඉක්මවා රාජ්‍ය වාණිජ විවිධ නීතිගත සංස්ථාව වෙතින් රු. 41,096,956 ක් වටිනා ජංගම නොවන වත්කම් මිලට ගෙන තිබුණි. | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය 331 සඳහාත්, දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25 සඳහාත් , පළාත් කාර්යාල 09 සඳහාත් කඩිනමින් කාර්යාලීය උපකරණ ලබා දීමට අවශ්‍ය වූ බැවින් සෘජු මිලදී ගැනීම් යටතේ අදාල මිලදී ගැනීම් සිදුකර ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුගතව නියමිත සීමාව තුල කටයුතු කිරිම. |

**3.4 වත්කම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) දෙපාර්තමේන්තුව **ACA-6** මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ අගය රු.**50,025,209** ක් වූ නමුත් භාණ්ඩාගාර **SA 80** වාර්තාවේ අගය රු. **35,684,297** ක් විය. මෙම නොසැසදෙන ශේෂ සම්බන්ධයෙන් රාජ්‍ය මුදල් චක්‍ර ලේඛ **02/2020** හි **10.1** ඡේදය මාර්ගෝපදේශ අංක **06** හි **3.3.** අනුව කටයුතු කර නොතිබුණි. | ආරම්භක ශේෂ රු.14,340,906 ක් ඇතුලත්ව නොතිබුණි. | මූල්‍ය නොවන වත්කම්වල වටිනාකම නිවැරදිව සටහන් කල යුතුවීම. |
| (ආ) බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුව ආරම්භ කරන අවස්ථාවේ එම ගොඩනැගිල්ලේ පැවති කාර්යාලයක තිබූ ඉන්වෙන්ට්‍රි භාණ්ඩ 22 ක් ලිඛිත පැවරීමකින් හෝ කිසිදු මූලාශ්‍රයකින් තොරව ඉන්වෙන්ට්‍රි ලේඛනයට ඇතුලත් කර තිබුණි. | වත්කම් නිසි පැවරීමක් හෝ භාරදීමක් කර නොතිබූ බැවින් අධ්‍යක්ෂ ජෙනරාල්ගේ ලිඛිත අනුමැතිය මත වත්කම් ලේඛනය වෙත ඇතුලත් කර ගන්නා ලදී. | ලිඛිත පැවරීමක් මත ඉන්වෙන්ට්‍රි ලේඛනගත කළ යුතු විම. |

**4.** **මානව සම්පත් කළමනාකරණය**

**----------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අනුමත කාර්යමණ්ඩලයෙන් සියයට 23 ක් පුරප්පාඩුව පැවතීම මත දෙපාර්තමේන්තුවේ කටයුතු පවත්වාගෙන යාමට බාධාවක් වී තිබුණි. | පිළිතුරු සපයා නැත | දැනට පවතින කාර්ය මණ්ඩලය මගින් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය පවත්වාගෙන යාමට හැකි නම් අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කිරීමටත් එසේ නොමැතිනම් පුරප්පාඩු පිරවීමටත් යෝජනා කෙරේ. |
| (ආ) | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර තනතුරු 20 න් තනතුරු 15 ක් හා කළමනාකරණ සේවා නිලධාරී තනතුරු 30 න් 23 පුරප්පාඩුව පැවතුණි. දෙපාර්තමේන්තු දෛනික රාජකාරිවලට මෙය බාධාවක් විය හැකි බව නිරීක්ෂණය විය. | පිළිතුරු සපයා නොමැත | -එම- |
| (ඇ) | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ සඳහන් ඇමුණුම 02 ආකෘතිය පදනම්කරගෙන සමාලෝචිත වර්ෂය සඳහා මානව සම්පත් සැලස්මක් පිළියෙල කර ක්‍රියාත්මකකර නොතිබුණි. | 2018.01.24 දිනැති අංක 02/2018 චක්‍ර ලේඛය ප්‍රකාරව 2021 සඳහා මානව සම්පත් සැලැස්මක් සකස්කරමින් පවතින අතර පෙන්වා දුන් අඩුපාඩු සකස් කර ගැනීමට කටයුතු කරමින් පවතී. | 02./2018 චක්‍ර ලේඛයේ උපදෙස් පිළිපැදිය යුතු වීම. |